2020/21 මහ කන්නය උස්ගල සියඹලංගමුව

සංශෝධිත වගා කාලසටහන

| අනු අංකය | විස්තරය | තීරණ |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බිම් ප්‍රමාණය | අක්කර 2200 |
| 02 | වගාකිරීමට අපේක්ෂිත බෝග වර්ගය | වී අක්කර 1950 :(මාස 3 හා 3.5)<br>අතිරේක බෝග අක්කර 250 |
| 03 | වගාව පිහිටවන ආකාරය | වාරි ජලයෙන් හා වර්ෂා ජලයෙන් |
| 04 | ගොවින් විසින් ඇළ වෙළි නඩත්තු කර අවසන් කලයුතු දිනය | 2020/10/20 |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට නඩත්තු නොකරනු ලැබූ ඇළවල් ගොවි සංවිධානය විසින් නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020/10/25 |
| 06 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කටයුතු ප්‍රධාන ඇළවල්වල හා ගොවි සංවිධාන විසින් නඩත්තු කටයුතු බෙදුම් ඇළවල්වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020/10/25 |
| 07 | කිරි ඉතිරවීමේ මංගල්‍යය | 2020/10/14 |
| 08 | මුල් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය | 2020/10/25 |
| 09 | වපුරා හෝ බීජ සිටුවා අවසන් කළ යුතු දිනය | 2020/11/20 |
| 10 | මුර ජලය ආරම්භ කරන දිනය | ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ දී තීරණය කරනු ඇත . |
| 11 | අවසන් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය | 2021/02/20 |
| 12 | යායෙන් ගවයින් ඉවත් කළ යුතු දිනය | 2020/11/20 |
| 13 | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2020/11/20 |
| 14 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2021/02/20 |
| 15 | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | 2021/03/10 |

වගා කොන්දේසි

01 කෙත් ඇල සහ බෙදුම් ඇලවල නඩත්තුව සඳහා කන්නයකට අක්කර 01ක් සඳහා රු.300.00ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

02 නියමිත දිනට කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන් විසින් නඩත්තු කළ යුතු අතර නියමිත දිනට නඩත්තු නොකරන කොටස් ගොවි සංවිධානය මගින් නඩත්තු කර නියමිත මුදල ගොවින්ගෙන් අය කර ගැනමට ගොවි සංවිධානයට බලය පැවරේ.(මීටරයට රුපියල් 150 බැගින්)

03 ගවයින් නිසා වගාවට සිදු වන හානි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් හානි පූර්ණය කර ගත යුතුයි.වාරිමාර්ග පද්ධතියට සිදු වන හානි සඳහා අලාභය තක්සේරු කර අය කර ගැනීමට බලය පවතී.

04 වගා රැස්වීමේ තීරණ වලට පටහැනිව ජලය ලබා ගැනීම හා වාරිමාර්ග නිර්මිතවලට හානි කිරිම සිදු කළ හොත් වාරි මාර්ග පනතට අනුව දඩ අය කිරිමටත් එසේම එම හානිය තක්සේරු කර තක්සේරු වටිනාකම අය කර ගැනීමටත් ගොවි සංවිධානයට බලය පැවරේ

05 අනවසරයෙන් ජලය ලබා ගැනිම වරදක් වන අතර එසේ ලබා ගත් ජලය වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ජලයේ වටිනාකම තක්සේරු කර අදාළ වරදකරුගෙන් අය කර ගැනිමට ගොවි සංවිධානයට බලය පැවරේ.

06 අනවසරයෙන් හෝ බලහත්කාරයෙන් ජල පොම්ප භාවිතයෙන් වාරි ජලය ලබා ගෙන රක්ෂිත හෝ ගොඩ ඉඩම් හෝ අනවසර ඉඩම් වගා කිරිම සම්පූර්ණයෙන් තහනම් වේ.

08. වෙනත් - ගොවිසංවිධාන නියෝජිතයන්

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම |
| --- | --- | --- |
| ගරු සභාපති ඒකාබද්ධ ගොවිසංවිධානය ගොවින් | වන අලි හේතුවෙන් වගාව ආරක්ෂා කරගැනීම මෙන්ම ගොවීන්ගේ ජීවිත සඳහාද විශාල තර්ජනයක් වී ඇතිබව සඳහන් කරන ලදී. | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා මේ වන විට ජාතික මට්ටමින් ප්‍රතිපත්තියක් සකසමින් සිටින බවත් ඒ සඳහා ඔබ සියළු දෙනාගේ අදහස් හා යෝජනා ලබාදෙන ලෙස එම ප්‍රතිපත්ති සැකසුම් කමිටුව විසින් දැනටමත් දැන්වීමක් එලකර ඇති බවත් දන්වා සිටින ලදී. තාවකාලික විසඳුමක් ලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය හා සම්බන්ධ වී ගම්මාන ආසන්නයෙන් අලිවැට ඉදිකර ගැනීම කඩිනම් කරගතයුතු බවත් අලිවෙඩි හැකි උපරිමයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා ලබා දීමට කටයුතු කරන බවත් ඒවා දැනට බවතින ක්‍රමවේදයන් මත ගොවීන් වෙත බෙදා හැරීමට කටයුතු කරන බවත් දන්වා සිටින ලදී. |

දිස්ත්‍රික් ලේකම් තුමාගේ මූලාසන කතාවෙන් හා ඒකාබද්ධ ගොවිසංවිධානයේ ගරු සභාපති තුමාගේ ස්තූති කතාවෙන් පසු කන්න රැස්වීමේ කටයුතු අවසන් කරලදී.

ආර්.එම්.ආර්.රත්නායක
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
කුරුණෑගල

පිටපත්:-.

1. වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය :- කාදැස
2. අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :- කාදැස
3. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල :- කාදැස
4. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ - කුරුණෑගල :- කාදැස
5. දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල :- කාදැස
6. කෘෂිකර්ම අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කුරුණෑගල :-කාදැස
7. .ගොවිජන සංවර්ධ නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල :- කාදැස
8. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ අන්තර් පළාත් අනුරාධපුරය :-අවශ්‍ය කටයුතු සඳහා
9. වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා
10. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ගල්ගමුව කලාපය :-අවශ්‍ය කටයුතු සඳහා
11. ප්‍රාදේශීය ලේකම් ගල්ගමුව/අඹන්පොල/ඇහැටුවැව :-අවශ්‍ය කටයුතු සඳහා
12. නේවාසික ව්‍යාපෘති කළමණාකරු මීඔය :-අවශ්‍ය කටයුතු සඳහා
13. සහකාර අධ්‍යක්ෂ ජාතික පොහොර ලේකම් කාර්යාලය කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා
14. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමුව :-අවශ්‍ය කටයුතු සඳහා
15. සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය මහව :-අවශ්‍ය කටයුතු සඳහා
16. කෘෂිකර්ම උපදේශක පාලුකඩවල/අඹන්පොල වන්නි ඉහලගම/ඇහැටුවැව/තාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
17. ගොවිජන සංවර්ධන නිලධාරි ගල්ගමුව :-අවශ්‍ය කටයුතු සඳහා